Liberté • Égalité • Fraternité
RÉPUBLIQUE FRANÇAISE

MINISTÈRE DE LA JUSTICE

11

# අයිතීන් පිළිබඳ ප්‍රකාශනය

## යුරෝපා සංගමය තුළ අත්අඩංගුවට ගැනීමට හැකි වරෙන්තුවක් ලබා ඇති හෝ තාවකාලික ව හෝ උදර්පනය සඳහා අත්අඩංගුවට ගැනීමට කරන ලද ඉල්ලීමක් සහිත පුද්ගලයකුට ඇති සහන.

ඔබ ව සිර භාරයට පමුණුවා ඇත්තේ යුරෝපය තුළ අත්අඩංගුවට ගත හැකි වරෙන්තුවක් සහ තාවකාලික හෝ උදර්පනය සඳහා අත්අඩංගුවට ගැනීමට කරන ලද ඉල්ලීමක් හේතුකොටගෙන කරන ලද අත්අඩංගුවට පත් වීමකින් පසු ව අභියාචනාධිකරණයේ මුල් සභාපතිවරයා විසින් බලය පවරන ලද විනිසුරුවරයකු විසින් ය. ඔබට රැකවරණය ලැබිය හැකි මූලික අයිතීන් මෙම ලේඛනයෙන් දක්වා ඇත.

***<u>ඔබ සිර අඩස්සියේ සිටින මුළු කාලය පුරාවට ම මෙම ලේඛනය ඔබ සන්තකයේ තබා ගත හැක</u>***

**වරදකාරී ක්‍රියාව සිදු කිරීම පිළිබඳ දැනුම**

යුරෝපා සංගමය තුළ අත්අඩංගුවට ගැනීමට වරෙන්තුවක් ලබා තිබීම හෝ තාවකාලික ව හෝ උදර්පනය සඳහා අත්අඩංගුවට ගැනීම සඳහා වන වරෙන්තුවක් ඔබට එරෙහි ව නිකුත් කර ඇති විටක, ඔබ හට චෝදනා නගා ඇති වරදකාරී ක්‍රියාව සිදු කරන ලදැයි නිගමනය කර ඇති දිනය, ස්ථානය සහ ඊට අදාළ අනෙකුත් කාරණා සම්බන්ධයෙන් දැන ගැනීමට ඔබට අයිතියක් ඇත.

**නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීම**

ඔබ විසින් තෝරා පත් කළ හෝ ඔබ වෙනුවෙන් පත් කළ නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට ඔබට හැකියාවක් ඇත.
ඔබගේ නීතිඥවරයා සමග නිදහසේ අදහස් හුවමාරු කර ගැනීමට හෝ ලිඛිත මාර්ගයෙන් සන්නිවේදනය කිරීමට ඔබට හැකියාව ඇති අතර ඔබ විසින් අධිකරණයේ පෙනී සිටින අවස්ථා වල දී ඔහුගේ සහාය ලබා ගැනීමට හැකි අතර අදාල නඩු දිනය පිළිබඳ ව නීතිඥවරයාට කලින් දැන්වීම කළ යුතු වේ. ඔබගේ නඩු ගොනුව පිරික්සීමට ඔහුට හැකියාවක් ඇත.

**නිශ්ශබ්ද ව සිටීමට ඇති අයිතිය**

ඔබ ව අධිකරණය ඉදිරියේ පෙනී සිටින අතරතුර යම් ප්‍රකාශයක් කිරීමට හෝ ඔබගෙන් අසන ලද ප්‍රශ්න වලට උත්තර දීම හෝ නිහඬ ව සිටීමේ තීරණයට ඔබට එළඹීමේ හැකියාව ඇත.

**භාෂා පරිවර්තකයකුගේ සහාය ලබා ගැනීම**

ඔබට ප්‍රංශ භාෂාව කථා කළ නොහැකි නම් හෝ තේරුම්ගත නොහැකි නම් ඔබ හට කිසිදු ගාස්තුවක් නොමැති ව, ඔබගේ ප්‍රශ්න කිරීම අතරතුර සහ ඔබගේ නීතිඥවරයා සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාෂා පරිවර්තකයකුගේ සහාය පැතීමට අයිතිය ඇත.

**ඔබට ලබා දිය යුතු සහන සඳහා අනුමැතිය ලබා ගැනීමට ඇති හැකියාව**

ඔබ ව සොයනු ලබන රටට නැවත යැවීම පිළිබඳ ව කැමැත්ත ලබා දීම හෝ නොදීම සම්බන්ධයෙන් ඔබට අයිතියක් ඇත. යම් කැමැත්ත ලබා දීමක දී, ඉතා කෙටි කලකින් ඒ පිළිබඳ ව තීන්දුවක් දීමට අධිකරණය ක්‍රියා කළ යුතු වේ. යුරෝපා සංගමය තුළ අත්අඩංගුවට ගැනීම සඳහා නිකුත් කළ වරෙන්තුවකට කැමැත්ත දීමේ දී ඔබ හට එකී තීරණය පසුව වෙනස් කළ නොහැක.

**නිදහස සීමා කළ හැකි කාල සීමාව සහ නිදහස් කරන මෙන් ඉල්ලා සිටීමට ඇති අයිතිය**

ඔබගේ හරවා යැවීම භාර ගැනීම හෝ නොකිරීම මත එම කාල සීමාව වෙනස් වේ.
ඕනෑ ම මොහොතක, ඔබගේ නිදහස් කිරීම සම්බන්ධ ව අධිකරණයෙන් ඉල්ලීමක් කිරීමට ඔබට හැකියාව ඇත.

**සමහර පුද්ගලයන් පිළිබඳ තොරතුරු**

ඔබගේ සිරගත කිරීම සම්බන්ධ ව ඔබට අවශ්‍ය කෙනෙකුට සහ විශේෂයෙන් ම ඔබේ පවුලේ සාමාජිකයන්ට දැනුම් දීමට

ඔබට අයිතියක් ඇත.
ඔබ විදේශීය ජාතිකයකු නම් තවදුරටත් ඔබට ඔබගේ රටේ තානාපති අංශ වෙත දැනුම් දීමේ හැකියාව ඇත.

**වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කර ගැනීම**

වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කර ගැනීමට ඔබට ඉල්ලීමක් කළ හැක.